මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**LAE/2025/62** **2025.04.21**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

## තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා වලංගු හැඳුනුම්පත්

2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පහත දැක්වෙන හැඳුනුම්පත් අතුරින් එක් හැඳුනුම්පතක් ඉදිරිපත් කර අනන්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**I.** **ජාතික හැඳුනුම්පත;**
**II.** **වලංගු රියදුරු බලපත්‍රය;**
**III.** **වලංගු විදේශ ගමන් බලපත්‍රය;**
**IV.** **මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත;**
**V.** **ජාතික හැඳුනුම්පත වෙනුවට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන තොරතුරු තහවුරු කිරීමේ ලිපිය.**

02. රාජකාරි හැඳුනුම්පත තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පිළිගනු ලැබුව ද පසුගිය ඡන්ද විමසීම්වලින් පසුව ඒ සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු සැලකිල්ලට ගෙන, මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්දහිමියන් ස්වකීය රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරන්නේ නම් එම තැපැල් ඡන්දහිමියා හඳුනාගැනීම හෙවත් අනන්‍යතාව පරීක්ෂා කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කාර්යය අධීක්ෂණයට තේරීම්භාර නිලධාරීන් විසින් පත්කොට ඇති නිලධරයා විසින් කරනු ඇත. එසේ නොවන අවස්ථාවල දී රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරන තැපැල් ඡන්ද හිමියන්ට ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා අවස්ථාව ලබා නොදිය යුතු බවට සහතික කිරීමේ නිලධාරීන් වෙත දන්වා සිටිනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්